உன்னதமானமாகாணஅரசாங்கசேவை
ADMIREABLE PROVINCIAL PUBLIC SERVICE

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උතුරු මැද පළාත -

மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - வடமத்தியமாகாணம்

**PROVINCIAL PUBLIC SERVICE COMMISSION – NORTH CENTRAL PROVINCE**

මෛත්‍රීපාල සේනානායක මාවත අනුරාධපුර ,

மைத்திரீபால சேனாநாயக்க மாவத்தை, அநுராதபுரம்

**Web Site:www.psc.nc.gov.lk** **Maithripala Senanayake Mawatha, Anuradhapura** **E-mail:pscncp@gmail.com**

**<u>ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය</u>**

උක්ත තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024.05.31 දින පෙ.ව. 09.00 ට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී (අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇත) පැවැත්වීමට නියමිතය. එදින මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට පහත සඳහන් ලිපිලේඛන සහ ඒවායේ සහතික කළ ඡායා පිටපත් ද රැගෙන ඉදිරිපත්වන ලෙස දන්වමි. ඡායා පිටපත් සහතික කිරීම අයදුම්කරු විසින්ම සිදු කර ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලිපිය.
II. ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය/ වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. උප්පැන්න සහතිකය
IV. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකය. අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ), උපාධි සහතිකය (අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සහතික වල විභාග දෙපාර්තමේන්තුවෙන් මගින් නිකුත් කළ සහතික පිටපත් රැගෙන ආ යුතුයි.)
V. 2024.05.31 දිනට උතුරු මැද පළාතේ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය (DS 04 ආකෘතිය මගින්). (අයදුම්කරුගේ පදිංචි කාල සීමාව ප්‍රමාණවත් නොවන විටදී කලත්‍රයාගේ පදිංචිය සලකා බැලීම සඳහා කලත්‍රයාගේ පදිංචි සහතිකය හා විවාහ සහතිකය)
VI. මෑතකදී ලබාගත් චරිත සහතිකයක්. (ග්‍රාම නිලධාරී සහතිකය හැර)
VII. අදාළ විය හැකි වෙනත් සහතික. (ඇත්නම්)
VIII. ඉල්ලුම් කරන විෂයකට සමගාමීව මිනිත්තු 5ක් නොඉක්මවන පරිදි ප්‍රායෝගික ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම්ව පැමිණිය යුතුය.

02. ඉහත දැක්වෙන ලේඛන/ සහතික සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙතම ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාරගනු නොලැබේ.

03. මෙම පරීක්ෂණයට පෙනී සිටීම තනතුර ලබාදීමට තහවුරුවක් නොවන අතර, පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ආදිය කිසිවක් ගෙවනු නොලැබේ. පරීක්ෂණය සඳහා සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා නැවත කැඳවීමක් නොකරන බවද සැළකිය යුතුය.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොමිෂන් සභාව | ஆணைக்குழு | **Commission** | **025-2221711** | ලේකම් | செயலாளர் | **Secretary** | **025-2224447** |
| කාර්යාලය | காரியாலயம் | **Office** | **025-2222773** | සහකාර ලේකම් | உரவி nRayhs | **Assistant Secretary** | **025-2227735** |
| ෆැක්ස් | பெக்ஸ் | **Fax** | **025-2224447** | පරිපාලන නිලධාරී | epUthfcj்தியோகத்தர் | **Administrative Officer** | **025-2222773** |